# මධ්‍යතන යුගයේ සම්භාව්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වූ සංගීත කලාව

නදීකා සඳමාලි පීරිස්

සිංහල අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
*nadeeka.pieris@yahoo.com*

සංගීතය යනු මිනිසාගේ භක්තිය, විනෝදය, වින්දනය සහ භාවාත්මක හැඟීම් ප්‍රකාශ කෙරෙන ලලිත කලා මාධ්‍යයකි. සංගීතය අර්ථවත් වනුයේ ගායනය සහ වාදනයෙහි සංකලනයයෙන් වන අතර The New Encyclopedia Britannica හි දැක්වෙන පරිදි 'සංගීතය ප්‍රෝටීනමය කලාවකි'. (Protein art) මධ්‍යකාලීන යුගය වන විට ලංකාවේ සාමාන්‍ය ජනතාව අතර පවා සංගීතය ලලිත කලාංගයක් වශයෙන් කිසියම් ප්‍රමාණයකට හෝ දියුණු වී පැවති බව සරස්වතී මණ්ඩපය, ශෘංගාර මණ්ඩපය, කවිකාර මණ්ඩපය යන සංගීත ආයතනවලින් හෙළි වූ අතර තත් යුගයේ සාහිත්‍යයෙහි අන්තර්ගත තොරතුරු අනුව ද සංගීත කලාව ප්‍රකට ව පැවති බව පැහැදිලි විය. මධ්‍යතන යුගයෙහි සම්භාව්‍ය සාහිත්‍යයෙන් නිරූපිත සංගීත කලාව පිළිබඳ විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වූ අතර මධ්‍යතන යුගයට අයත් සම්භාව්‍ය සාහිත්‍යයෙන් සංගීත කලාව පිළිබඳ කවර තොරතුරු සන්නිවේදනය වන්නේ ද? යන පර්යේෂණ ගැටලුවට අනුව සිදු කළ මෙම පර්යේෂණයේ දී පුස්තකාල පරිශීලනය හා අන්තර්ජාලය මගින් දත්ත එක් රැස් කිරීම සිදු කෙරිණි. ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය සිදු කළ අතර, මෙම පර්යේෂණයේ දී මධ්‍යතන යුගයට අයත් සම්භාව්‍ය සාහිත්‍ය කෘති ප්‍රාථමික  මූලාශ්‍රය ලෙස ගැනිණි. එහි දී ප්‍රාථමික සහ ද්විතියික දත්ත තුලනාත්මක නිරීක්ෂණය මගින් තර්කානුකූල නිගමනයන්ට එළඹීම සහ විස්තරාත්මක ව විවරණය කිරීම සිදු විය. එහි දී මධ්‍යතන යුගයට පමණක් සීමා වූ අතර තත් යුගයේ සංගීත කලාව දියුණුව පැවතුණු බව සාහිත්‍ය නිර්මාණ මගින් ප්‍රකට විය. මධ්‍යතන යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍යය මගින් තත් සමයෙහි සමාජ සංස්කෘතික පසුබිම හා විවිධ සාහිත්‍යාභාසයන්ට අනුව ද සංගීත කලාව පිළිබඳ මැනවින් විවරණය වූ බව පැහැදිලි විය. ඇතැම් විට ඉන්දියානු කලා ඉතිහාසයෙන් ද ප්‍රකට නොවන වාද්‍ය භාණ්ඩ රැසක් මෙම පුරාණ සාහිත්‍යයෙන් ඉදිරිපත් වුණි. ඒ තත් යුගයේ සංගීත කලාවේ පැවති මනා අභිවෘද්ධිය නිසාවෙනි. ඒ අනුව පුරාණ ජනතාවගේ සංගීත කලාව පිළිබඳ පැවති සමීප සබඳතාව, සෞන්දර්යාස්වාදය, බුද්ධිය හා ආධ්‍යාත්මික ව පැවති උසස් බව නිගමනය කළ හැකි ය.

**මූල පද:** සම්භාව්‍ය සාහිත්‍යය, සංගීත කලාව, මධ්‍යතන යුගය

# The Art of Music: Specified from Medieval Classical Literature

Nadeeka Sandamali Peries

Department of Sinhala, Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka
*nadeeka.pieris@yahoo.com*

Music is a sophisticated medium through which human's devotion, pleasure and emotional expression are expressed. Music means a combination of singing and playing, and music is a diverse art, as expressed in The New Britannica. By the Medieval Period, music had developed to some extent into a fine art, even among the common people of Sri Lanka. It was revealed by musical institutions like *Saraswati Mandapam*, *Shrungara Mandapam* and *Kavikara Mandapam* and it is clear that the art of music was well known as per the information contained in the records of the present day. The purpose of this study was to examine the musical art depicted in medieval literature and the musical art from medieval classical literature. What information about the art of music is conveyed from the literature of the Medieval Period? In this study, which was conducted based on the research problem, data were collected through library references and the Internet. Data analysis was carried out using the qualitative data analysis method. In this study, literary works from the Medieval Period were used as the main source. By considering the primary and secondary data, balanced and logical conclusions were drawn and a detailed interpretation was made. There it was known from literary works that the development of musical art was limited only to the Medieval Period. There, it was known through literary works that the development of musical art was limited to the Medieval Period only. The source of medieval Sinhala literature presented numerous musical instruments that are unknown from the social and cultural background of the ongoing period and the history of multiple arts in this historical literature. The musical art of that era exists because of this great achievement. Accordingly, it can be concluded that the ancient people’s close correlation with the art of music, aesthetics, intelligence, and spirituality is superior.

**Keywords:** Classical literature, Medieval Period, Music